පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 06

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- ඉතිහාසය

පාසලේ නම : ..........................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 2 යි

**1 - කොටසේ සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

**11 කොටසින් පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න**

- **අංක 1 - 5 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට යොදා ගන්නා සාහිත්‍යමය මූලාශ්‍රයකි

i. පැරණි ගොඩනැගිලි
ii. සමරු පලක
iii. මහා වංශය
iv. සෙල්ලිපි

2) මිනිසෙකු වීමට නැඹුරුවක් ඇති කළ පැරණිතම වානරයා හැඳින්වෙන්නේ

i. හෝමෝසාපියන් යන නමින්
ii. හෝමෝ ඉරෙක්ටස් යන නමින්
iii. හෝමෝ හැබිලස් යන නමින්
iv. ඔස්ට්‍රලෝපිතිකස් යන නමින්

3) ශරීර ලක්ෂණ අනුව අප්‍රිකාවේ ජීවත්වන මානව වර්ගය හැඳින්වෙන්නේ

i. කොකසොයිඩ්
ii. ඔස්ට්‍රලොයිඩ්
iii. නිග්‍රොයිඩ්
iv. මොංගෝලොයිඩ්

4) පලමු වරට නගරයක් අසල වැවක් ඉදිකළ රජු ලෙස සැළකෙනුයේ

i. දුටුගැමුණු රජු.
ii. දේවානම්පියතිස්ස රජු.
iii. පණ්ඩුකාභය රජු
iv. වසභ රජු.

5) මින්නේරි දෙවියන් ලෙස පිදූම් ලැබූ රජතුමා වන්නේ

i. ධාතුසේන රජු
ii. වළගම්බා රජු
iii. දේවානම්පියතිස්ස රජු
iv. මහසෙන් රජු

- අංක 6- 10 දක්වා ප්‍රශ්න සඳහා වරහන් තුළ ඇති පිළිතුරු අතරින් සුදුසු පිළිතුරු යොදාගෙන හිස්තැන් පුරවන්න

6) ඉන්දියාවේ බටහිර ප්‍රදේශය පාලනය කළ ගෞතමීපුත්‍ර සාතකර්ණී රජු විසින් ……………………...ක්‍රමය ආරම්භ කරන ලදී

7) ………………… ……………………වාසය කළ මිනිසා චිත්‍ර ඇඳීම සිදුකොට ඇත.

8) මමීකරණය ලොවට හඳුන්වාදෙන ලද්දේ ……………………………… වැසියන් විසිනි.

9) ඉසිගිරි නැමති ඇමතිවරයෙකු විසින් යාපන ප්‍රදේශය පාලනය කළ බව ……………………………… හි සඳහන් වේ.

10) ………………………….. වැසියන් විසින් පිළිස්සූ මැටි ගඩොල් භාවිතා කළ බවට සාක්ෂි හමුව තිබේ

(ඉන්දුනිම්න / පුරා ශිලා යුගය /නව ශිලා යුගය /ශක වර්ෂ / වල්ලිපුරම් රන් සන්නස / පනා කඩුව තඹ සන්නස / ඊජිප්තු / මෙසපොතේමියානු )

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් √ ලකුණ ද වැරදි නම් x වැරදි ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න

11) නයිල් ගංගාව අප්‍රිකාවේ පිහිටා ඇත. (…. )

12) පිත මහ රජු යනුවෙන් හැඳින්වූයේ වසභ රජුයි (…. )

13) මෙසපොතේමියාව වර්තමානය වන විට අයත් වන්නේ ඉරානයටයි (…. ).

14) ලොව පැරණිතම අක්ෂර පද්ධතිය ලොවට හඳුන්වා දූන්නේ මෙසපොතේමියානු ශිෂ්ටාචාරයයි. (…. ).

15) පාද කීපයක් තිබෙන හැකරැල්ලන් වැනි සතුන් .බිහිවූයේ සිලුරියන් යුගයේදීය (…. ).

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

16) යෝධ ඇලෙන් ලබා ගන්නා ජලයෙන් පෝෂණය වන වැව වන්නේ ………………………..

( තිසාවැව / කණදරා වැව / නුවර වැව ) යි.

17) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලද්දේ …………………………………දීය

( මහනුවර දළදා මාළිගාවේදී ය. / අභයගිරි විහාරයේදීය/ මාතලේ අලු විහාරයේදීය )

18) විජය කුමරු සමග ………………………...පිරිස මෙරටට පැමිණි බව ඉතිහාසයේ සඳහන් වේ.

( සත් සීයක් . / පන්සීයක් / හාරසීයක්)

19) ධාන්‍ය වර්ගයක් ලෙස වී මුලින් ම වගා කරන ලද්දේ …………..………………...….ජාතිකයන්ය.

( ඉන්දියානු / මෙක්සිකානු / චීන )

20) බුදුන් වහන්සේ ගේ පරිනිර්වාණය සිදුවූයේ …………….…………දීය .


( ක්‍රි. ව. 274 / ක්‍රි. පූ. 544 / ක්‍රි. පූ. 278 ) ( ලකුණු $2 \times 20 = 40$ යි

11- කොටස

පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්යය වන අතර ප්‍රශ්න අංක 2 සිට 7 දක්වා ඇති ප්‍රශ්න අතරින් හතරකට පමණක් පිළිතුරු සපයන්න

1) ( අ ) පහත සඳහන් ස්ථාන සඳහා ගැළපෙන අක්ෂර ශ්‍රී ලංකා ආකෘති සිතියමේ දක්වා ඇති අක්ෂර වලින් තෝරා ලියන්න

i. මල්වතු ඔය
ii. අනුරාධ පුරය
iii. හුරුළුවැව
iv. දඹකොළපටුන
v. ත්‍රිකුණාමලය
vi. කලාවැව




(ලකුණු 1 × 6 =6 යි )


( ආ) පහත සඳහන් පින්තූර ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

a



i. මෙම පින්තූරයෙන් දැක්වෙන අවස්ථාව කුමක්ද?

ii. මෙකල ශ්‍රී ලංකාවේ රජ කරවූ රජු කවුරුන්ද?



b

i. මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කවුරුන්ද?

ii. මෙම මූර්තිය අයත් වන ශිෂ්ටාචාරය කුමක්ද ?

c



i. මෙම මූර්තියෙන් නිරූපණය වන්නේ කවරෙක්ද ?

ii. මෙය කුමන ශිෂ්ටාචාරයකට අයත් වූවක්ද?

( ලකුණු 2× 3 = 6 යි )

2)

i. ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඉගෙනීමට යොදා ගන්නා ප්‍රධාන මූලාශ්‍ර කොටස් දෙක නම් කරන්න.

( ලකුණු2 යි )

ii. ඉතිහාසයේ විවිධ සිදුවීම් අයත් කාල මැනීමට භාවිතා කරන ක්‍රම හතරක් ලියන්න ( ලකුණු 4 යි )

iii.a ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන තුනක් ලියා දක්වන්න ( ලකුණු 3 යි )

b ඔබ සඳහන් කළ එක් ප්‍රයෝජනයක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 3 යි )

3)

i. පහත a b ප්‍රකාශ වල හිස් තැනට සුදුසු වචන වරහන් තුළින් තෝරා ලියන්න.


a පෘථිවියේ මුලින්ම බිහි වූ ජීවියා හඳුන්වන්නේ ……………….. නමිනි.

b පෘථිවියේ ශාක වර්ග පැතිරීම ආරම්භ වූ යුගය ……………නමින් හැදින්වේ.

(සිලුරියන් යුගය / හැකරැල්ලන් /ප්‍රොකායෝට් බැක්ටීරියාව / පැලියෝසොයික යුගය ) (ලකුණු 2 යි )

ii. a ආදී මානවයින් සිය අවශ්‍යතා සපුරා ගැනීමේ දී භාවිතා කළ උපකරණ සකස් කිරීමට යොදා ගත් ද්‍රව්‍ය දෙකක් නම් කරන්න.

b මෙම නිර්මාණය අයත් යුගය හා මෙය නිර්මාණය කොට ඇත්තේ කුමන ද්‍රව්‍යයක් උපයෝගී කර ගෙනද යන්න ලියා දක්වන්න.



( ලකුණු 4 යි )

iii. වරහන් තුළ ඇති පිළිතුරු යොදා ගනිමින් පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න

| මානව වර්ගය | විශේෂ හැකියාවන් |
|---|---|
| ඔස්ට්‍රලෝපිතිකස් | …………………. |
| …………………. | ගලකින් තවත් ගලකට ගසා මුවහත් මූණතක් සාදා ගැනීම |
| හෝමෝ ඉරෙක්ටස් | …………………. |
| …………………. | සතුන්ගේ ඇටකටු වලින් නිවාස සෑදීම |
| හෝමෝ සාපියන් | …………………. |

(හෝමෝ හැබිලස් / පාද දෙකෙන් ඇවිද යෑම /එකිනෙකා අතර අදහස් හුවමාරුවට හැකි භාෂාවක් භාවිතය / හෝමෝ නියැන්ඩතාලීසස් /ගින්දර භාවිතයට පෙළඹීම ) ( ලකුණු 6 යි )

4)

i. මෙවලම් වල ස්වරූපය අනුව මිනිසාගේ සංස්කෘතික දියුණුව දැක්වෙන ප්‍රධාන අවධීන් දෙකක් නම් කරන්න.

( ලකුණු 2 යි )

ii. මධ්‍ය ශිලා යුගයේ මිනිසාගේ විශේෂ ගති ලක්ෂණ දෙකක් ලියා දක්වන්න. ( ලකුණු 4 යි )

iii. නව ශිලා යුගයේ මිනිසාගේ ජීවන රටාව ඇසුරෙන් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| අංශය | කටයුතු කළ ආකාරය |
|---|---|
| ආහාර සපයා ගැනීම | |
| මෙවලම් භාවිතය | |
| ආගමික කටයුතු | |

( ලකුණු 6 යි )

5)

i. ලෝකයේ බිහි වූ පැරණිතම ශිෂ්ටාචාර දෙකක් නම් කරන්න ( ලකුණු 2 යි )

ii. පහත සඳහන් සොයා ගැනීම් ලෝකයට දායාද කළේ කුමන ශිෂ්ටාචාරයන් දැයි ලියා දක්වන්න.

1 වෘත්තයකට අංශක 360 ක් ඇති බව

2 වෙඩි බෙහෙත් සොයා ගැනීම

3 රබර් බෝලය නිපදවීම

4 කඩදාසි හා මුද්‍රණ යන්ත්‍රය නිපදවීම ( ලකුණු 4 යි )

iii. ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ නගර නිර්මාණය පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. ( ලකුණු 6 යි )

6)

i. ශ්‍රී ලංකාවේ වාසය කළ මුල් කාලීන මානවයා සිය ආහාර අවශ්‍යතාවය සපුරාගත් ආකාර දෙකක් නම් කරන්න

(ලකුණු 2 යි )

ii. ශ්‍රී ලංකාවේ වාසය ආදී මිනිසා ආහාර ලෙස ලබා ගත් සත්ත්ව ආහාර වර්ග දෙකක් හා ශාක ආහාර වර්ග දෙකක් නම් කරන්න. ( ලකුණු 4 යි )

iii. විජය කුමරු මෙරටට පැමිනෙන අවධිය වන විට ශ්‍රී ලංකාවේ වාසය කළ මානවයින් ගේ ජීවන රටාව පිළිබඳ තොරතුරු කෙටියෙන් ලියා දක්වන්න. ( ලකුණු 6 යි )

7)

i.a අනුරාධපුර නගරය නිර්මාණය කළ රජු කවුරුන්ද?

b අනුරාධපුරයේ පිහිටි ථූපාරාමයට වටදා ගෙයක් නිර්මාණය කළ රජු කවුරුන් ද ? ( ලකුණු 2 යි )

ii. පණ්ඩුකාභය රජතුමා අනුරාධපුර නගරයේ ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කළ ආකාරය පිළිබඳ කරුණු දෙකක් ලියා දක්වන්න ( ලකුණු 4 යි )

iii.දේවානම්පිය තිස්ස රජු බුදුදහම වෙනුවෙන් සිදුකළ සේවාවන් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

(ලකුණු 6 යි )

# 6 - ශ්‍රේණිය ඉතිහාසය පිළිතුරු පත්‍රය 2023 තෙවන වාර පරීක්ෂණය උතුරුමැද පළාත

1) මහා වංශය
2) ඔස්ට්‍රලෝපිතිකස්
3) නිග්‍රොයිඩ්
4) පණ්ඩුකාභය
5) මහසෙන් රජු
6) ශක වර්ෂ
7) පුරා ශිලා යුගයේ
8) ඊජිප්තු
9) වල්ලිපුරම් රන් සන්නසේ
10) ඉන්දූනිම්න
11) √
12) x
13) x
14) √
15) √
16) තිසාවැව
17) මාතලේ අළු විහාරයේදි
18) සත් සීයක්
19) චීනය
20) ක්‍රි.. පූ 544 දිය

ලකුණු 2 x 20 = 40 යි

11 - කොටස

1) අ )

| | | |
|---|---|---|
| i. | මල්වතු ඔය | A |
| ii. | අනුරාධපුර | C |
| iii. | හුරුළුවැව | G |
| iv. | දඹකොළපටුන | F |
| v. | ත්‍රිකුණාමලය | D |
| vi. | කලාවැව | B |

ලකුණු 6 යි

ආ)

a

i. ජයශ්‍රිමා බෝධිය ශ්‍රි ලංකාවට වැඩමවීම
ii. දේවානම්පිය තිස්ස රජු

b

i. නෞෆට්ටි රැජින
ii. ඊජිප්තු

c

i. පූජකයෙකි
ii. ඉන්දූනිම්න

ලකුණු 6 යි

2)

i. සාහිත්‍ය මූලාශ්‍ර හා පුරා විද්‍යාත්මක මූලාශ්‍ර — ලකුණු 2 යි

ii. ක්‍රි. පූ. ක්‍රි. ව. ශක වර්ෂ බුද්ධ වර්ෂ හිජ්රි වර්ෂ මින් හතරක් — ලකුණු 4 යි

iii. a වර්තමානය වඩා යහපත් කර ගැනිමට අනාගතය සකස් විය යුත්තේ කෙසේද යන්න සිතා බැලීමට විවිධ ජන කොටස් වලට හා ඔවුන්ගේ ඇදහිලි විශ්වාසයන්ට ගරු කිරීමට සමගියෙන් හා සහජිවනයෙන් කටයුතු කිරිමට ආදී — ලකුණු 3 යි

b මින් එක කරුණක් විස්තර කිරිමට — ලකුණු 3 යි

3)

i. a ප්‍රොකායෝට්    b පැලියෝසොයික    ලකුණු 2 යි

ii. a ගල්  සත්ත්ව ඇටකටු  ලී  මින් දෙකක්    ලකුණු 2 යි.

b පුරා ශිලා යුගය    සත්ත්ව ඇට කැබැල්ලක්    ලකුණු 2 යි

iii.

| මානව වර්ගය | විශේෂ හැකියාවන් |
|---|---|
| ඔස්ට්‍රලෝපිතිකස් | පාද දෙකෙන් ඇවිද යෑම |
| හෝමෝ හැබිලස් | ගලකින් තවත් ගලකට ගසා මුවහත් මූණතක් සාදා ගැනීම |
| හෝමෝ ඉරෙක්ටස් | ගින්දර භාවිතයට පෙළඹීම |
| හෝමෝ නියැන්ඩතාලීසස් | සතුන්ගේ ඇටකටු වලින් නිවාස සෑදීම |
| හෝමෝ සාපියන් | එකිනෙකා අතර අදහස් හුවමාරුවට හැකි භාෂාවක් භාවිතය |

ලකුණු 6 යි

මෙහි හිස්තැන් 5 ම හරි නම් ලකුණු 6 ම ලබා දෙන්න

4)

i. පූර්ව ශිලා යුගය  මධ්‍ය ශිලා යුගය  නව ශිලා යුගය  මින් දෙකක්    ලකුණු 2 යි

ii. දඩයමින් ආහාර එකතු කර ගැනිම  දුනු ඊතල භාවිතය ආරම්භ වීම  ශාකමය ආහාර කෙරෙහි වැඩි නැඹුරුවක් දැක්වීම  එක තැනක වැඩි කාලයක් ජීවත් වීම දැව දඬු කොළ අතු භාවිතයෙන් නිවාස තනා ගැනීම  වර්ණ යොදා ගනිමින් ගල් පර්වත බිත්ති මත චිත්‍ර ඇදිම  මින් දෙකක්    ලකුණු 4 යි

iii.

| අංශය | කටයුතු කළ ආකාරය |
|---|---|
| ආහාර සපයා ගැනීම | ධාන්‍ය වගා කිරිම  සතුන් හීලෑ කරගෙන කිරි මස් ලොම් බිත්තර ලබා ගැනිම |
| මෙවලම් භාවිතය | ලෝහ වර්ග සොයා ගැනිම  ආයුධ තැනීම |
| ආගමික කටයුතු | ගොවිතැන් කටයුතු වල සහ සතුන්ගේ ආරක්ෂාව පතා දෙවියන් ඇදහීම |

ලකුණු 6 යි

5)

i. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය  ඉන්දූනිම්න ශිෂ්ටාචාරය  චීන ශිෂ්ටාචාරය ඊජිප්තු ශිෂ්ටාචාරය මින් දෙකක්    ලකුණු 2 යි

ii.

1 වෘත්තයකට අංශක 360 ක් ඇති බව    මෙසපොතේමියානු ශිෂ්ටාචාරය

2 වෙඩි බෙහෙත් සොයා ගැනීම    චීන ශිෂ්ටාචාරය

3 රබර් බෝලය නිපදවීම    මායා ශිෂ්ටාචාරය

4 කඩදාසි හා මුද්‍රණ යන්ත්‍රය නිපදවීම    චීන ශිෂ්ටාචාරය    ලකුණු 4 යි

iii. ඉන්දූනිම්න ශිෂ්ටාචාරයේ නගර නිර්මාණය පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.

මොහෙන්ජෝදාරෝ හරප්පා ධොලවීර හා කාලිබන්ගන් ප්‍රධාන නගර වීම සැලසුම් සහගතව නගර ඉදිකර තිබීම ක්‍රමවත් ලෙස ඉදි කළ ජල කානු ළිං හා අපද්‍රව්‍ය බැහැර කරන නල පද්ධති භාවිතා කොට තිබීම පාරවල් මැනවින් සකස් කර තිබීම ප්‍රවාහනය ඉතා හොඳින් සිදුකර තිබීමසියළු නගර වල මිලියන 5 ක් පමණ ජීවත්ව සිට ඇත. පිළිස්සූ ගඩොලින් නිවාස තනා තිබීම දියුණු ජලනල පද්ධතියක් නිවාස වල තිබීම ආදි ලකුණු 6 යි

6)

i. දඩයමින් වන ද්‍රව්‍ය එක්රැස් කරමින් ලකුණු 2 යි

ii. මුවන් සාවුන් දඩුලේනුන් ඉත්තෑවන් ඉබ්බන් මීමින්නන්. තලගොයින් ගොළුබෙල්ලන් මින් දෙකක් වල්දෙල් වල්කෙසෙල් කටුඅල මින් දෙකක් ලකුණු 4 යි

ගොවිතැනට පුරුදුවූ මෙම ජනයා කඳුකර ප්‍රදේශ වල වාසය කිරීම ධාන්‍ය වර්ග ආහාරයට ගැනීම මැටි වළං නිපදවීම යකඩ සහිත ගල් උණුකොට යකඩ සාදා ගැනිම ගල් මෙවලම් ඉතා සුළු වශයෙන් භාවිතා කොට තිබීම වරිච්චිගෙවල් සාදා ඒවායේ ජිවත් වීම මිය ගිය ඥාතින් වෙනුවෙන් සොහොන් තනා තිබීම ලකුණු 6 යි

7)

i.a පණ්ඩුකාභය

b වසභ ලකුණු 2 යි

ii. නගරය වටා දිය අගල් ඉදි කර තිබීම ප්‍රධාන දිසා හතරේ දොරටු හතරක් නිර්මාණය කිරීම නගරයේ අනෙකුත් කොටස් සම්බන්ධ වන ලෙස මාර්ග පද්ධතියක් පිහිටුවීම ලකුණු 4 යි

iii.මෙම රජුගේ කාලයේදී බුදුදහම මෙරටට රැගෙන ඒම මහමෙවුනා උයන හා එහි තිස්සාරාමය නමින් පන්සලක් සාදා පූජා කිරීම ථූපාරාමය ඉදි කිරීම භික්ෂූන් වහන්සේලාට දානය වැළදීම ලහබත් ගෙය නමින් දාන ශාලාවක් ද තවත් ගොඩනැගිලි ද කරවීම පිරිවෙන් කීපයක් ඉදි කිරීම ජය සිරිමා බෝධිය මෙරටට වැඩම කරවා ගැනීම මහබෝධිය රෝපණය හා මහබෝගෙය නමින් ගොඩනැගිල්ලක් කරවීම භික්ෂූන් වහන්සේලාගේ පරිහරණයට පොකුණු කරවීම ගල්ලෙන් සකස් කර පූජා කිරීම

( වාක්‍ය 6 කින් ලියා දක්වන්න ) ලකුණු 6 යි


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න